සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **11 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 11** |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| ***දේශීය නර්තනය – II*** | ***පැය දෙකයි*** |
| ***Dancing - II*** | ***Two hours*** |

- පළමුවැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.

01. (i) පොකුරු බෙරය යනුවෙන් හඳුන්වන්නේ කුමන වාද්‍ය භාණ්ඩයද? ..............................................................

(ii) පහතරට නර්තන සම්ප්‍රදාය හා බැඳි ජන නාටකයෙකි. ..................................................................................

(iii) මිනික්කු හා පච්චා යනු .............................................................. නර්තනයේ වේෂ නිරූපණ ක්‍රම දෙකකි.

(iv) ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ .............................................................. මඩුවේ දීය.

(v) බෞද්ධාගමික සිද්ධස්ථානවල සිදුකෙරෙන දවුල් තම්මැට්ටම් හොරණෑ වාදනය ............................... නමින් හැඳින්වේ.

(vi) කොහොඹාකංකාරි ශාන්තිකර්මයට අයත් පූර්ව චාරිත්‍ර විධි දෙකකි.

i ............................................................ ii ............................................................

(vii) කෝලම් නාටකයට අයත් මානුෂ (මිනිස්) චරිත දෙකකි.

i ............................................................ ii ............................................................

(viii) උඩරට නර්තන සම්ප්‍රදායේ කස්තිරමට සමාන සබරගමු හා පහතරට නර්තන කොටස් නම් කරන්න.

i සබරගමු ............................................................ ii පහතරට ............................................................

(ix) උඩරට නර්තන සම්ප්‍රදායට හා පහතරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකකි.

i උඩරට............................................................ ii පහතරට............................................................

(x) ගීත අනුව නර්තන නිර්මාණයේ දී යොදාගන්නා චලන වර්ග දෙකකි.

i ............................................................ ii ............................................................

i සිට v දක්වා පිළිතුරකට ලකුණු 01 බැගින් - 05

vi සිට x දක්වා පිළිතුරකට ලකුණු 02 බැගින් - 10

(මුළු ලකුණු - 05 + 10 = 15 )

(02) (i) තුන් තිතට අයත් තාල ප්‍රභේද 2 ක් නම් කරන්න

(ii) උඩරට - කුද ගත ගත දොං
පහතරට - ගදි කිට ගත දොං
සබරගමු - ජිමි තග තා දොං
ඉහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායට අයත් බෙරපදය තුන් තිතේ තාල රූපයට ප්‍රස්තාර කරන්න.

(iii) ඉන්දු දිසාවට ඉඹුල් විමානෙට
හිරු දෙවි අධිපති වන්නේ
රන්සිරි වසගෙන සුරත දරාගෙන
තුරගෙකු පිට වැඩ ඉන්නේ
යන ග්‍රහ පන්ති කවිය මාත්‍රා 4 / 4 තාල රූපයට ප්‍රස්තාර කරන්න.

(ලකුණු - 05 X 3 = 15 )

(03) පහත සඳහන් මාතෘකා අතුරින් 3 ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අංග රචනය.

(ii) තුන් තිතේ ප්‍රභේද

(iii) ගැමි නැටුම්

(iv) වන්නම් වල පොදු ලක්ෂණ (ලකුණු - 05 X 3 = 15 )

(04) සම්ප්‍රදායන් අනුව දේශීය ශාන්තිකර්ම වෙනස් වුව ද ආකෘතියෙහි සමානතා ලක්ෂණ දැකිය හැකිය.

(i) දෙවොල් මඩු ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් හා පූර්ව චාරිත්‍ර විධි 3 ක් නම් කරන්න.

(ii) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ ගායනය සහිත හා රහිත නර්තන අංග 2 ක් නම්කර එක් නර්තන අංගයක් පැහැදිලි කරන්න.

(iii) උඩරට නර්තන සම්ප්‍රදායේ හා සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩවල ඇති ව්‍යුහයේ සමාන හා අසමානතා විමසුමකට ලක් කරන්න. (ලකුණු - 05 X 3 = 15 )

(05) විනෝදාස්වාදය සඳහා අතීතයේ සිට පැවත එන ජන නාටකයකි කෝලම් නාටකය.

(i) කෝලම් නාටකය ප්‍රචලිත ප්‍රදේශ නම් කරන්න

(ii) කෝලම් නාටකයේ කථා පුවත විස්තර කරන්න.

(iii) කෝලම් නාටකයේ රගමඩල පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු - 05 X 3 = 15 )